කම්කරු දෙපාර්තමේන්තුව
தொழில் திணைக்களம்
DEPARTMENT OF LABOUR

දුරකථන / தொலைபேசி / Telephone: 2581142 2581149 2581143 2584373 2581146 2593260 2581148
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2581145

මගේ අංකය / எனது இல / My No: ආ3/7/5/2011
ඔබේ අංකය / உமது இல / Your No.:

කම්කරු මහලේකම් කාර්යාලය, තැ.පෙ.575, කොළඹ 05, ශ්‍රී ලංකාව.
தொழில் செயலகம்,அ. பெட்டி இல.575,கொழும்பு 05, இலங்கை.
Labour Secretariat, P.O.Box 575, Colombo 5. Sri Lanka.

2011.11.04

සහකාර කම්කරු කොමසාරිස්.
දිස්ත්‍රික් කම්කරු කාර්යාලය

.................................................

.................................................

<u>නිවාඩු නිකේතන සම්බන්ධවයි.</u>

කම්කරු දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන නිවාඩු නිකේතනවල නවාතැන් ගැනීමේදී සාමාජිකයන්ට එම නිවාඩු නිකේතනය මගින්ද මුදල් ගෙවා කාමර වෙන් කරවා ගැනීමේ හැකියාව ඇති අතර ඒ සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කරන මෙන් දන්වා සිටිමි.

01). දෙපාර්තමේන්තු සාමාජිකයෙකුගේ පෞද්ගලික ගමනක් වෙනුවෙන් දිනකට එක් කාමරයක් සඳහා රු. 350.00 ක මුදලක් අය කළ යුතුය.

02). දෙපාර්තමේන්තු සාමාජිකයෙකුගේ රාජකාරි ගමනක් වෙනුවෙන් දිනකට එක් කාමරයක් සඳහා රු.150.00 ක මුදලක් අය කළ යුතුය.
(රාජකාරි ගමනක් සඳහා ඉල්ලීමක් කර තිබීම අනිවාර්යය වේ.)

03). වෙනත් දෙපාර්තමේන්තුවක/අමාත්‍යාංශයක සාමාජිකයෙකු වෙනුවෙන් දිනකට එක් කාමරයක් සඳහා රු. 450.00 ක මුදලක් අය කළ යුතුය.

04). පුද්ගලික අවශ්‍යතාවයන් මත අවලංගු කිරීම්වලදී මුදල් නැවත නොගෙවිය යුතු අතර ඒ වෙනුවට එම මුදල් වර්ෂය තුළදීම වෙනත් දිනයක් සඳහා ඉල්ලුම් කරන්නේ නම් එක් කාමරයක් සඳහා රු.100.00 ක අමතර ගාස්තුවක් අය කළ යුතුය.

05) සෑම මසකම නවාතැන් ගන්නා පුද්ගලයන් හා සම්බන්ධ තොරතුරු පහත සඳහන් ආකෘති පත්‍රය මඟින් ආයතන ප්‍රධානියාගේ අනුමැතිය ඇතිව ඊළඟ මස 10 වන දිනට පෙර ප්‍රධාන කාර්යාලයට එවිය යුතුය.

06) නිවාඩු නිකේතනයට පැමිණ මුදල් ගෙවා නවාතැන් ගන්නා පුද්ගලයින් සඳහා දැනට සේවය කරන ස්ථානයේ ආයතන ප්‍රධානියාගේ අනුමැතිය සහිත අයදුම් පත්‍ර හා අදාල මුදල් චෙක්පත ඊළඟ මස 10 වන දිනට පෙර ප්‍රධාන කාර්යාලයට ලැබීමට සැලැස්විය යුතුය.

07) නිවාඩු නිකේතනය තුල උත්සව හා ප්‍රිය සම්භාෂණ පැවැත්වීමට ඉඩ නොදිය යුතු අතර විධිමත් පටිපාටියකින් තොරව බාහිර පුද්ගලයන් රඳවා ගැනීම සපුරා තහනම් වේ.

08) නවාතැන් ගන්නා පුද්ගලයන්ගේ අයදුම් පත්‍ර සහ මුදල් ලැබීමට අදාල රිසිට් පත් ඇතුලත් ලේඛණයක් නඩත්තු කල යුතුය.

ඉහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් අදාල නිවාඩු නිකේතන ආසන්න අධීක්ෂණයට ලක්කරමින් ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

හේරත් යාපා
වැ .බ .කම්කරු කොමසාරිස් ජනරාල්

හේරත් යාපා
වැ.බ. කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.